වරකාපොල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ගිණුම්කරන අඩුපාඩු
-----------------------------

(අ) පුනරාවර්තන අයහාරය රු.600,900 ක් වැඩියෙන් මූල්‍ය හා මෙහෙයුම් ප්‍රකාශයේ දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, ප්‍රාග්ධන ලැබීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද , දක්වා තිබුණි.

(ආ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු.300,030 ක වරිපනම් බදු ආදායම හා රු.7,067 ක දැන්වීම් පුවරු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා වර්ෂයේ අවසාන දිනට කලින් ලද ආදායම රු. 307,067 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුලින් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු. 46,350 ක කාබනික පොහොර තොගය අවසන් තොග යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් අක්කර 06 පර්චස් 14 ක් වූ ඉඩම් කොටස් 16 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ජර්නල් සටහන් අංක 2015/23 මගින් පසුගිය වර්ෂයේ පුස්තකාල පොත් පරිත්‍යාග රු.20,207 ක් වැඩියෙන් ගිණුම් ගත කිරීම නිවැරදි කිරීමට රු. 95,474 ක් ගැලපීම් කිරීම නිසා රු. 75,267 ක් පුස්තකාල පොත් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පසුගිය වර්ෂයේ ඉදිරියට ලැබූ වරිපනම් හා අක්කර බදු රු.102,267 ක් එම වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කිරිම නිවැරදි කිරීමට ජර්නල් සටහන් අංක 03 මගින් වරිපනම් බදු ගිණුමට හා සමුච්චිත අරමුදල් ගිණුමට රු. 138,352 ක් ගලපා ඇතත් එහි නිවැරදි අගය රු. 130,881 ක් වීම නිසා රු. 7,471 ක් වැඩියෙන් වරිපනම් ආදායම ගිණුම්ගත කර ඇත.

(ඇ) වරිපනම් බදු ලෙස රු 5,997,879 ක් බිල් කර ඇතත් වරිපනම් බදු ආදායම ලෙස ගිණුම්ගත කර ඇත්තේ රු.5,800,000 ක් නිසා රු. 197,879 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු සඳහා වට්ටම් ගෙවීම් රු. 173,956 ක් වුවත් එය ගිණුම් ගත කර නොතිබුණි.

(එ) ජර්නල් සටහන් අංක 5 ට අනුව සභාවට ලැබී තිබූ රු. 3,223,220 ක් වටිනා කැබ් රථය රු.2,323,220 ලෙස ගිණුම්ගත කිරීම නිසා වාහන හා ප්‍රාග්ධනය යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු. 900,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සිංගල් ඩ්‍රම් ලෙලෙන තලනයේ වටිනාකම යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) පුස්තකාල පොත් පරිත්‍යාග රු. 30,782 ක් හා මිලදී ගැනීම් රු. 23,202 ක් ලෙස ගිණුම් වලට ගෙන ඇතත් සත්‍ය වශයෙන් ලැබී තිබූ පුස්තකාල පොත් පරිත්‍යාග වටිනාකම රු. 28,227 ක් හා මිලදී ගැනීම් රු.19,120 ක් හෙයින් පුස්තකාල පොත් රු.6,637 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) ලැබිය යුතු පොදු වැසිකිලි කුලී රු.112,042 ක් හා මස්කඩකුලී රු. 5,042 ක් ගිණුම්ගත නොකිරීම නිසා ආදායම් ණයගැතියෝ රු.117,084 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත සඳහා ලැබිය යුතු රු. 51,990,913 ක් ණය ගැතියන් යටතේ දක්වා නොතිබුණි.

1.3.2 නොසැසඳුනු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව ගිණුම් විෂයන් 12 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.123,851,162 ක් වූ අතර ඊට අදාල උපයෝගි ලේඛණ/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගෙ එකතුව රු.173,820,430 ක් වූයෙන් වෙනස රු. 49,969,268 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.32,341,462 ක් වූ අතර ඉන් රු.23,689,062 ක් වසරකට වඩා පැරණි ශේෂයක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.43,980,512 ක් වූ අතර එයින් රු. 1,687,754 ක් වසරකට වඩා පැරණි ශේෂයක් විය.

1.3.4 නීති,රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ. 189 | 2012 දෙසැම්බර් 05 දින ලැබී තිබූ රු. 10,350 ක් වටිනා චෙක්පත් අගරු වීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 371(2) (ඇ) | අවස්ථා 07 කදී තත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් ලබාගත් රු. 2,552,602 ක මුදලක් පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv වනපරිච්ඡේදය I. 1.6 හා 4 වගන්තිය | | ස්ථාන මාරුවී ගිය නිලධාරින් 08 දෙනෙකුගෙන් ද විශ්‍රාමික නිලධාරින් දෙනෙකුගෙන්ද සේවය හැරගිය නිලධාරින් 06 දෙනෙකුගෙන්ද 1988 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුල අයවිය යුතු රු.485,690 ක සේවක ණය මුදල් අයකරගෙන නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2014 දෙසැම්බර් 29 දිනැති 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 2 වැනි වගන්තිය | (i) | 2014 ඔක්තෝබර් 24 වැනි දිනට අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ප්‍රදානය කළ යුතු වුවත් 2014 ජනවාරි 01 දින සිට 2014 ඔක්තෝබර් 24 වැනි දිනට එක් දිනක් හෝ සේවයේ යෙදී නොසිටි සේවකයින් දෙදෙනෙකු හා දින 20 ක් පමණක් සේවය කර ඇති සේවකයෙකු සඳහා ද ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. |
| | (ii) | උක්ත චක්‍රලේඛයේ දැක්වෙන සේවා ගණයන්ට අයත් නොවන සභාපතිවරයාගේ පුද්ගලික ලේකම් වරිය iii වන ශ්‍රේණියේ පුස්තකාල සහායක තනතුරට ස්ථිර පත්වීමක් 2014 ඔක්තෝබර් 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 2014 නොවැම්බර් 19 දින ලබාදී තිබුණි. |

1.3.5 බලය නොලත් ගනුදෙනු

------------------------

සභාව නමින් ලියාපදිංචි නොවූ මාර්ග සහ අයිතිය තහවුරු නොවූ දේපල 08ක් සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.1,270,833 ක් සභා අරමුදලින් යොදවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිපල

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම වූ රු.10,422,546 ක් වූ අතර ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම රු.10,075,413 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපලයේ රු.347,133 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.347,133 ක වර්ධනයට ආදායම් වර්ෂයන් 3 ක වැඩිවීම හා වියදම් විෂයන් 4 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම | 2015.01.01 දිනට පැවති හිඟයෙන් හිඟ | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,043,196 | 2,793,927 | 7,787,000 | 6,302,104 | 5,249,269 | 1,484,896 | 6,734,165 |
| බදු කුලී | 2,185,181 | - | 7,045,000 | 5,847,573 | 2,185,181 | 1,197,427 | 3,382,608 |
| බලපත්‍ර ගාස්තු | 77,760 | 28,750 | 1,320,000 | 1,550,516 | 49,010 | (230,516) | 181,506 |
| වෙනත් ආදායම් | 28,355,111 | 12,149,510 | 72,203.000 | 54,242,102 | 16,205,601 | 17,960,898 | 34,166,499 |

සභාව ඉදිරිපත් කළ ඉහත හිඟ ආදායම් විස්තරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් හා බදු ශේෂය රු.6,734,165 ක් වූ අතර මූලා ප්‍රකාශණ අනුව ශේෂය 8,638,985 වූයෙන් රු.1,904,820 ක වෙනසක් විය.

2.3.2 වරිපනම් බදු

-----------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) වගන්තියේ විධිවිධාන අනුව වරිපනම් හෝ අක්කර බද්දක් නොගෙවූ විට දේපල තහනමට ගෙන විකිණීමෙන් හෝ මුදල් අයකල යුතු වුවත් වරිපනම් කොට්ඨාශ පහක වරිපනම් ඒකක 7,124 කි න් 2015 දෙසැම්බර් 31 දිනට හිගව තිබූ රු. 8,187,167 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 05 කට වරක් වරිපනම් බදු තක්සේරුවක් සිදු කල යුතු වුවත් 2008 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහාද වරිපනම් බදු අය කරමින් පැවතුනි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට රජයේ දේපල සම්බන්ධයෙන් වරිපනම් ඒකක විසිපහක හිඟ ශේෂය රු.128, 367 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 අක්කර බදු

-------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්කර බදු ඒකක 572 න් 2015 දෙසැම්බර් 31 දිනට රු. 353,418 ක හිඟ ශේෂයක් පැවති අතර එයින් දීර්ග කාලයක සිට එන රු.47,830 ක් අයකර ගැනීමට කටයුත කර නොතිබුණි.

2.3.4 විනෝද බදු

----------------

විනෝද බදු ආඥා පනතේ 01 වගන්තියේ 2 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සභාපතිවරයා විසින් නිකුත් කරන ලද 2014 නොවැම්බර් 28 දිනැති අංක 1952/4 දරන ගැසට් නිවේදනය පරිදි සංදර්ශන සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍ර වලින් 25 % ක් හා සිනමා ශාලා සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍රවලින් 7.5 % ක විනෝද බද්දක් අයකළ යුතුය. සභා බල ප්‍රදේශයේ එක් සිනමා ශාලාවකින්

විනෝද බදු අයකර ගෙන නොතිබුණි. අනෙක් සිනමා ශාලාවෙහි අලෙවි කරන ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට පෙර මුද්‍ර තබා නොතිබූ අතර, සිනමා ශාලා හිමිකරු විසින් නිකුත් කල බවට ඉදිරිපත් කළ ප්‍රවේශ පත්‍ර විස්තර අනුව බදු අයකිරීම නිසා අයවිය යුතු සත්‍ය ආදායම් සභාවට අහිමි වී තිබුණි. 2015 ඔක්තෝබර් මාසයේදී සැනකෙළි හා සංදර්ශන භූමිය තුල අලෙවි වන ප්‍රවේශ පත්‍රද මුද්‍රා තැබීම කල යුතු වුවත් මුද්‍රා තබා නොතිබුණි. මුද්‍රණය කළ ප්‍රවේශ පත්‍ර ප්‍රමාණය, අලෙවි කළ ප්‍රවේශ පත්‍ර ප්‍රමාණය හා අයවිය යුතු බදු මුදල් ඇතුලත් ලේඛණයක් නඩත්තු කර නොතිබුණු අතර සිනමා ශාලා දෙකකින් 2016 මාර්තු 15 දිනට හිඟ විනෝද බදු මුදල වූ රු. 177,344 ක් අය කරගැනීමට ද කටයුතු කර නොතිබුණි.

2.3.5 ඉඩම් විකිණීම මත බදු

-------------------------

(අ) සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්ගේ 2005 ජුනි 01 දිනැති අංක 2005/04 දරන චක්‍රලේඛයේ 3 (v ) වගන්තිය ප්‍රකාර ඉඩම් විකුණුම්කරුවන් සමඟ ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

(ආ) මෙම බල ප්‍රදේශය තුල විකුණන ලද අක්කර 14 රූඩ් 03 පර්චස් 07 ක ඉඩම් කොටස් 07 කට අදාල තාවකාලික තක්සේරු වන රු.2,218,884 ක බදු අයකර තිබූ නමුත් උක්ත චක්‍රලේඛයේ 3 (v ) වගන්තිය ප්‍රකාර විකුණුම් වටිනාකම මත බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඇත්නාවල ඉඩම වෙනුවෙන් පොදු කටයුතු සඳහා වෙන් කරන ලද 10% ක ඉඩම් ප්‍රමාණය ඔප්පුවක් මගින් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 ව්‍යාපාර බදු

---------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 156(1) වගන්තිය ප්‍රකාර කර්මාන්ත ලැයිස්තුවක් පිළියෙල කර මාර්තු 31 දිනට හෝ ඊට පෙර සභාලේකම් වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ව්‍යාපාර බදු, වෙළඳ බලපත්‍ර සඳහා වූ ඉල්ලුම්පත්‍ර ලේඛණයක සටහන් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබූ අතර ව්‍යාපාර වර්ග 09 කට අයත් ව්‍යාපාරික ආයතන සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ ලියාපදිංචි හෝටල්වල ඉකුත් වර්ෂයේ ආදායමින් 1% ක බද්දක් ගෙවිය යුතු වුවත් විගණිත මූල්‍ය ප්‍රකාශ ලබා නොදී හෝටල් හිමිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලැබීම් වාර්තා පදනම් කරගෙන බදු අයකර තිබූ අතර එය වසර 03 කට වරක් ලබාගෙන තිබුණි.

2.3.7 වෙනත් ආදායම්

-----------------

(අ) සභාව සතු ZA -5220 දරන බැකෝලෝඩර් යන්ත්‍රය 2015 ජූලි 09 දින සිට 28 දින දක්වා කාලය තුළ රු.75,620 ක ඉන්ධන යොදා මීටර් පැය 119.9 ක් සේවයේ යොදවාගෙන තිබුණි. සභා තීරණ අනුව මීටර් පැයක් සඳහා රු.2,250 ක ගාස්තුවක් කුලියට දීමේ දී අයකරගත යුතු වුවත් කිසිදු ආදායමක් ලැබී නොතිබුණු අතර මෙම කාල සීමාව තුළ බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදවා තිබූ කාර්යයන් පිළිබඳ තොරතුරු ද පවත්වා නොතිබුණි.

(ආ) වරකාපොල බස් නැවතුම්පල අසල පොදු වැසිකිළිය 2014 වර්ෂය සඳහ පවත්වාගෙන යාමට ටෙන්ඩර් ලබාගත් තැනැත්තා ගිවිසුම් කොන්දේසි කඩකරමින් මාසිකව බදු මුදල් ගෙවීම් පැහැර හැර තිබුණු අතර 2016 මාර්තු 17 දින විගණන අවස්ථාව වන විට හිඟ බදු මුදල රු.72,042 ක් විය.

(ඇ) සභාව මඟින් 2015ජුනි මස සිදු කරන ලද සමීක්ෂණයේදී ස්ථිර දැන්වීම් පුවරු 126 ක් සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරමින් පැවති බවට හඳුනාගෙන තිබුණු අතර , ඒ සඳහා අයවිය යුතු බදු මුදල රු.337,610 ක් 2016 මැයි 02 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඇ) සභාව සතු 148/1/බී දරන ගොඩනැගිල්ල 2012 වර්ෂය සඳහා කිරිහලක් පවත්වාගෙන යාමට ටෙන්ඩර් කැඳවා තිබුණ අතර රු.206,000 ක් වූ වැඩිම මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු ටෙන්ඩරය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. දෙවනුව රු.175,500 ක් වූ වැඩිම මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩරය පිළිගත යුතු වුවත් කිසිදු හේතු දැක්වීමකින් තොරව රු.101,500 ක මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩරය පිළිගැනීමෙන් රු.73,500 ක් සභා අරමුදලට අහිමිව තිබුණි.

කිරිහල සඳහා පිළිගත් ටෙන්ඩරය භාර ගැනීම ප්‍රතික්ෂේප කළ ටෙන්ඩර්කරුගේ රු.7,500 ක ටෙන්ඩර් තැන්පත් මුදල සභාව සතු කළයුතු වුවත් 2012 ඔක්තෝබර් 9 වැනි දින අංක 2054 දරන වවුචරයෙන් ආපසු ගෙවා තිබුණි.

2.3.8 වාහන නැවැත්වීමේ ගාස්තු

-------------------------------

2008 වර්ෂයේ පනවා ඇති අතුරු ව්‍යවස්ථාව අනුව වාහන නවතා තැබීමේ ගාස්තු අයකර නොතිබුණ අතර, ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු පමණක් අයකර තිබුණි. විධිමත් පරිදි නැවතුම්පල ස්ථාන හා ලියාපදිංචි රථවාහන ප්‍රමාණය ගණනය කර ගාස්තු අය කිරීමට කටයුතු නොකිරීමෙන් ලබාගත යුතුව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

2.3.9 සම්ප්‍රේක්ෂණ කුළුණු ගාස්තු

-------------------------------

(අ) සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුලුනු 22 ක් සඳහා ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/08 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව රු. 519,000 ක පෙරසැරි ගාස්තු අයකර ගැනීමට පියවර නොගැනීමෙන් සභා අරමුදලට ලබාගත යුතුව තිබුණු ආදායම අහිමිව තිබුණි.

(ආ) සම්ප්‍රේෂණ කුළුණු සඳහා 2015 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අයකරගෙන නොතිබුණි.

2.3.10 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම රු. 3,087,034 ක් හා මුද්දර ගාස්තු ආදායම රු.11,2016,903 ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) සබරගමුව පළාත් සභාවෙන් ලබා දී තිබූ වාහන 08 ක හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලැබී තිබූ වාහන 05 ක අයිතිය ප්‍රාදේශීය සභා නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සුදුසුකම් නොතිබූ තැනැත්තෙකු 2015 ජූලි 06 දින සේවා ගිවිසුම් මත බැකෝ ලෝඩරයේ ක්‍රියාකරු වශයෙන් බඳවාගෙන තිබුණි.

(ඇ) සේවා ගිවිසුම්මත සේවයේ යොදවාගත් සේවකයින් 23 ක් සඳහා 2014ඔක්තෝබර් 24 වන දින සිට ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරු වල ස්ථිර කර තිබුණ ද එදින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා රු.98,553 ක් සේවක අර්ථ සාධක අරමුදලට ද රු.24,638 ක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට ද සභාවේ දායකය වශයෙන් ගෙවීම් කර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සභාව සතු පොදු වැසිකිළි 03 ක් පැවතියද ඒවා ටෙන්ඩර් කැඳවීමට හෝ සභාව මඟින් නඩත්තු කර පවත්වාගෙන යාමට 2015 හා 2016 වර්ෂයන්හි කටයුතු කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පාලනය

-----------------------

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදනමත ක්‍රියාත්මක වූ ගමින් ගමට දොරින් දොරට වැඩ සටහන යටතේ අල්ගම ඉහළගම පන්සල හරහා ඉහලගමට යන මාර්ගයේ පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු.1,462,290 න් රු.296,845 ක් ලැබී ඇතත් අනතුරුව කර්මාන්තයේ වැඩ අත්හැර තිබුණි.

(ආ) 2014 වර්ෂය තුළ කර්මාන්ත ඉදිකිරීම සඳහා ලැබී තිබූ ප්‍රාග්ධන ආධාර මුදල් තැන්පත් ගිණුමින් වියදම් කර තිබූ අතර, ඉන් ව්‍යාපෘති 05 ක් සඳහා ලැබී තිබූ රු.6,992,766 කින් රු.5,667,571 ක් පමණක් වැය කර තිබීම නිසා රු.1,325,195 ක් ඉතිරි වී තිබුණි.

3.4 අවිධිමත් ගණුදෙණු

---------------------

(අ) රෝගී වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(එ) වගන්තියේ විධිවිධාන යටතේ නියමය ප්‍රතිපාදන නොතිබියදී මහසභා අනුමැතියකින්ද තොරව මන්ත්‍රී වරයාගේ බිරිඳට රු.100,000 ක් ලබා දුන් බවට සඳහන් කරමින් සභාපතිවරයා විසින් රු. 100,000 ක් සභා අරමුදලින් ලබාගෙන තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තියේ විධිවිධාන වලට පටහනිව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව පෙර පාසල් ගුරු පුහුණු වැඩමුළුවක් සඳහා රු. 17,379 ක්, පෙර පාසල් සඳහා ලිස්සන බෝට්ටුවක්, මේස සහ පුටු ලබාදීම වෙනුවෙන් රු.71,000 ක් ද, ගෙවතු වගා තරඟයක් හා උත්සවයක් වෙනුවෙන් රු.80,709 ක්ද සහ සාහිත්‍ය උත්සවයක් වෙනුවෙන් රු.23,395 ක වියදම් වශයෙන් එකතුව රු.192,483 ක් දරා තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව මරණාධාර සමිති, සුබසාධක සමිති, ප්‍රජාශාලා සඳහා විදුලිය ලබාදීම වෙනුවෙන් රු.116,224 ක්ද මරණාධාර සමිතියක් සඳහා පුටු ලබාදීම වෙනුවෙන් රු.999,400 ක් ද, අඩු ආදායම් ලාභී පවුල් සඳහා සෙවිලි තහඩු ලබාදීම වෙනුවෙන් රු. 999,600 ක් ද, සුබසාධන සමිති 2 ක් හා පෙර පාසල් අළුත් වැඩියාව සඳහා රු.336,416 ක වියදමක්ද , පෞද්ගලික වගාබිමක් සඳහා ජල සැපයුමක් ලබා දීම වෙනුවෙන් රු.99,490 ක්ද, වියදම් දරා තිබුණි.

(ඈ) ජනාධිපති ලේකම්ගේ 2006 පෙබරවාරි 01 දිනැති අංක CSA/1/1/2006දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව සභාපතිවරයාගේ සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් නොමැතිව විදේශ සංචාරයක් සඳහා රු.188,016 ක් සභා අරමුදලෙන් වියදම් කර තිබුණි.

04. ගිණුම කටයුතු භාවය හා යහ පාලනය
--------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණ අයවැය ලේඛණයේ ප්‍රතිපාදන වෙන් කර තිබුණු වැය විෂයන් 49ක එකතුව රු. 22,938,000ක ප්‍රතිපාදන 100% ක් ද වැය විෂයන් 33ක එකතුව රු.20,851,007ක ප්‍රතිපාදන වලින් 50%ක් 99%ක් පරාසයක්ද වශයෙන් එකතුව රු.43,789,007ක් සභා කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) වැය විෂයන් 5ක අනුමත ඇස්තමේන්තු ඉක්මවා රු.9,048,677ක් වැය කර තිබුණි.

5. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය